

# කැළණි විහාරය

# Kelani Viharaya

A SihaDerana.com e-book Publication

Copyright © 2008 www.SihaDerana.com
All Rights Reserved Worldwide.



# කැලණි විහාරය

කැලණි විහාරය බුදුන් වහන්සේගේ පහස ලැබූ අතිපූජනීය ස්ථානයකි. බුදුන් වහන්සේගේ තෙවන ලංකාගමනය වශයෙන් හැඳින්වෙන නිසාද අගනුවරට ආසන්නයේ පිහිටි අතිපූජනීය වූ ස්ථානයක්වූ නිසාද කැලණි විහාරය ඉතා වැදගත්ය.

කැලණි පූජාභූමිය තුළ පිහිටි ධාන්‍යාකාර හැඩයෙන් යුත් චෛත්‍යය හා විහාරගෙය ද විභීෂණ දේවාලයද දෙස්-විදෙස් ජනයා අතර ප්‍රසිද්ධියට පත්ව ඇත.

මහියංගණං නාගදීපං - කළ්‍යාණං පද ලාංඡනං

සොළොස්මස්ථාන වන්දනය කෙරෙන මෙම ගාථාවේ 'කළ්‍යාණං' යන පදයෙන් කියවෙන්නේ කැලණි විහාරය පිළිබඳවයි.

# කැලණි චෛත්‍යය

"ආයාචනාය මණිඅක්ඛි මහෝරගස්ස
යස්මිං නිසීදි භගවා මණිමණ්ඩපස්මිං
තස්සො පරිට්ඨිත මුපට්ඨිත වීතරාගං
කල්‍යාණි චේතිය මහං සිරසා නමාමි"

මෙය කැලණි විහාරය වඳින ගාථාවයි. එහි අදහස වන්නේ "මණි අක්ඛිත නා රජුගේ ඇරයුමෙන් වැඩිය බුදුන් වහන්සේ වැඩ හිඳ ධර්ම දේශනා කළ මැණික් මණ්ඩපය පිහිටි ස්ථානයේ ඉදිකළ කැලණි චෛත්‍යයට සිරස නමා නමස්කාර කරමි"යන්නයි.

බුදුරජාණන් වහන්සේ තෙවන වරට ලංකාවේ කැලණියට වැඩම කළ අවස්ථාවේ මැණික් පුටුවක් මත හිඳ ධර්ම දේශනා කළ බව සඳහන්ය. එම මැණික් පුටුව තැබූ මණ්ඩපය පිහිටි ස්ථානයේ මැණික් පුටුව තැන්පත් කොට මණිඅක්ඛිත නාරජු විසින් කැලණි චෛත්‍යය තනවන ලදී.

කැලණි චෛත්‍යය ධාන්‍යාකාර හැඩයෙන් යුක්තය. එනම්, ධාන්‍ය ගොඩක නැතහොත් වී ගොඩක හැඩයයි. එහි වට ප්‍රමාණය අඩි 180 ක් පමණ හා උස අඩි 90 ක් පමණ වේ. වර්තමානයේ එසේ වුවද අතීතයේදී මෙම චෛත්‍යය වරින් වර ප්‍රතිසංස්කරණය කළ බවට සාධක ඇත.



# විහාර මන්දිරය

කැලණියේ විහාර මන්දිරය අන් විහාරවල ඇති විහාර මන්දිරයන්ට වඩා වෙනස් වූත් සුවිශේෂී වූත් ලක්ෂණ සහිත වූවකි. විහාර මන්දිරය අඩි තුනක් පමණ උසින් යුක්ත වූ වේදිකාවක් මත ඉදි කොට ඇත. එහි අඩි 150 ක් පමණ වන අතර පළල අඩි 90 ක් පමණ වේ.

කැලණි විහාර මන්දිරයට ඇතුළුවීමට ඇති ප්‍රධාන දොරටුව ඉදිරිපස පඩිපෙළක් හමුවේ. එය ආරම්භ වන්නේ ගිනිදැල්, ඇත්රූප, ලියවැල් ආදිය කැටයම් කළ තීරු හතරක් හා මැද පද්මයද සහිත වූ සඳකඩ පමණකිනි. පඩි 5 කින් යුක්ත පඩිපෙළේ සෑම පඩියකම පයට පෑගෙන කොටස නොව සිරස් කොටසේ දෙපස හා මැද පද්මය ලකුණු කොට ඇත. පඩිපෙළ ඉහළම පඩියත් ඉන් පසු විහාරගෙයි භූමියත් අතර සිරස් කොටසේ දෙපස හා මැද වාමන රූප සළකුණු කොට ඇත. පඩිපෙළ ඇත් හිස සහිත කොරවක් ගල් 2 කි.

විහාර ගෙය ඉදිරිපස මුදුනේ විචිත්‍ර කැටයමකින් යුක්ත වූ මකර තොරණකි. එහි මධ්‍යයේ හිඳි ඉරියව්වෙන් වැඩ හිඳින බුද්ධ ප්‍රතිමාවක් නෙළා ඇත.

පඩිපෙළ නැගීමෙන් පසු විහාර ගෙයට ඇතුළුවීමට පෙර ඇති කොටස තුළ චතුරශ්‍රාකාර, අෂ්ටාශ්‍රාකාර ආදී විවිධ හැඩයෙන් යුක්ත වූ කුළුණු ඇත. පඩිපෙළ අවසන් වන ස්ථානයේ එනම් ඉහළම පඩියේ දෙපස විශාල ඇත් හිස් දෙකකින් ආරම්භ වන කුළුණු දෙකකි. මෙම කුළුණු වල සිංහ රූප,පලාපෙති හා පද්මය කැටයම් කර ඇත. එම කොටසේ වහලයද සිතුවම් වලින් අලංකාර කොට ඇත. මෙම කොටසේ දෙපසින් කුඩා පඩිපෙළවල් 2 ක් තනා ඇත.

ප්‍රධාන ප්‍රවිශ්ට ස්ථානයට අමතරව ඇති එම ස්ථාන දෙකේද පඩිපෙළ පාමුල සඳකඩ පහණ බැගින් ඇති අතර එහි විශේෂත්වය වනුයේ ඇතා,අශ්වයා, ගවයා, සිංහයා යන සත්ත්වයින් සිව්දෙනාම එහි කැටයම් කොට තිබීමයි. පඩිපෙළවල් දෙකේම පඩි 5 බැගින් ඇති අතර ඒවායේද සිරස් කොටසේ දෙපස හා මැද පද්මය කැටයම් කර ඇත. පඩිපෙළ දෙපස ගජසිංහ රූපය සහිත කොරවක්ගල් දෙකක් තනා ඇත.

කැලණියේ විහාර මන්දිරය කොටස් හතරකින් යුක්තය. එනම් රජ පිළිමගෙය, ඕත් පිළිම ගෙය, අලුත් විහාර ගෙය හා රන් පිළිමගෙයයි. කුළුණු සහිත කොටසින් පසු මුලින්ම හමුවන්නේ රජ පිළිම ගෙයයි. කුළුණු සහිත කොටසේ සිට රජ පිළිම ගෙයට ප්‍රවිෂ්ට වීමට ඇති දොරටුවේ ඉහළින්ම කුඩා මකර තොරණක කැටයමක් දැකිය හැක. ඒ මධ්‍යයේ හිඳි බුදු පිළිමයක් කැටයම් කොට ඇත.

ඊට පහළින් බුද්ධ චරිතයට අදාළව විවිධ අවස්ථා කැටයම් කොට ඇත. දොරටුව දෙපස මුරදේවතාවන් දෙදෙනෙකුගේ රූප කැටයම් කර ඇත. ඉන් අනතුරුව ගලින් කරන ලද සඳකඩ පහණක් හා ගල් උළුවස්සකින් රජ පිළිමගෙයට ඇතුළුවීමට හැකිය. සඳකඩ පහණ පද්මය, පලාපෙති , ගිනිදැල්, හංස මෝස්තර ආදියෙන් අලංකෘත කොට ඇත. ගල් උළුවස්ස ලියවැල් ආදියෙන් අලංකාර කොට ඇත.

## - රජ පිළිමගෙය -

රජ පිළිමගෙයට ඇතුළු වන්නෙකුට ඉදිරියෙන්ම පෙනෙන්නේ රන් පිළිමගෙය තුළ ඇති රන් ආලේපිත බුද්ධ ප්‍රතිමාවයි. රජ පිළිමගෙයට ඇතුළු වූ විට එහි ඇති කළු ගලක H.D.W යන අකුරු තුන හා 18 3/25 88 යන ඉලක්කම් කොටා කිසියම් සලකුණක් තබා ඇති අයුරු දැකිය හැකිය. ඉංග්‍රීසි අකුරු තුනෙන්

සඳහන් කොට ඇත්තේ විහාර මන්දිරය ප්‍රතිසංස්කරණය කරන ලද හෙලේනා (H) ඩෙප්(D) වීරසිංහ(W) මැතිණියගේ නමයි. ඇය විවාහයෙන් පසු හෙලේනා විජයවර්ධන ලෙස හැඳින්විණි. ඉලක්කම් වලින් දැක්වෙන්නේ ප්‍රතිසංස්කරණකටයුතු ආරම්භ කළ දිනයයි. 1888–3–25 වන එම දිනය වෙසක් පොහොය දිනයක් වීමද විශේෂය.

රජ පිළිම ගෙයි ඇති සිතුවම් දහඅටවන සියවසට පමණ අයත් යැයි සැලකේ. රජ පිළිම ගෙයට ඇතුල්වන්නෙකුට ඉදිරියෙන් පෙනෙනබිත්තියේ ඉහළ තීරුවේ සත් සතිය සිතුවම් කොට ඇත. ඊට පහළින් රන් පිළිමගෙයට ඇතුළු වීම සඳහා වන උළුවස්සකි. ඊටත් පහළ එම බිත්තියේ උළුවස්සට දකුණු පසින් පහළ කෙළවරට වන්නට ඔටුණු පැළඳි මින්සුන් දෙදෙනෙකුගේ රූප දක්වා ඇත. ඔවුන් සුරතින් මල් දරා සිටින අයුරින් සිතුවම් කර ඇත.

රජ පිළිමගෙයි වම් පස බිත්තියේ ඉහළ තීරුව සොළොස්මස්ථාන සිතුවම් කිරිම සඳහා වෙන් කර ඇත. වම් පස බිත්තියට මුහුණලා සිටින විට බිත්තියේ දකුණේ සිට වමට සොළොස්මස්ථාන දක්වා ඇත. මහියංගණ චෛත්‍යය දකුණු කෙලවරේ දක්වා ඇත. ඉන්පසු පිළිවෙළින් නාගදීපය, කැලණිය, ශ්‍රී පාද ස්ථානය, දිවා ගුහාව, දීඝවාපී චෛත්‍යය, මුතියංගණ චෛත්‍යය, තිස්සමහාරාමය, ශ්‍රී මහා බෝධිය, මිරිසවැටිය, රුවන්වැලි සෑය, ථූපාරාමය, හයාගිරි වෙහෙර, ජේතවන දාගැබ හා සේල චෛත්‍යයත් අවසානයේ වම්පස කෙලවරට වන්නට කතරගම දාගැබ් වහන්සේ දක්වා ඇත.

රජ පිළිම ගෙයට ඇතුළුවන උළුවස්සට ඉහළින් බුදුන් වහන්සේ පන්සියයක් රහතන්වහන්සේලා සමග අහසින් වැඩම කොට රුවන් ගෙයි මිණි පළඟ පිට වැඩ සිටි අවස්ථාවක චිත්‍රණය කොට ඇත.

මෙම බිත්ති තුනේම එනම් රජ පිළිමයට ඇතුළුවන දොරටුව අසල සිටින්නෙකුට ඉදිරියෙන් පෙනෙන බිත්තියත් එම පුද්ගලයාගේ පිටුපසින් ඇති බිත්තියත් ඔහුට වම් පසින් ඇති බිත්තියත් යන තුනේම ඉතිරි ඉඩකඩ වෙන්කොට ඇත්තේ ජාතක කතා සිතුවම් කිරීම සඳහාය. එහි ඇති ජාතක කතා අතර ධර්මපාල ජාතකය, සාම ජාතකය, මහා සීලව ජාතකය, තේලපත්ථ ජාතකය, වෙස්සන්තර ජාතකය, මහාකණ්හ ජාතකය හා දහම්සොඬ ජාතකය යන කතා 7 වේ.

වම්පස බිත්තියේ පහළම තීරුවත් ඉදිරිපස සත් සතිය දැක්වෙන සිතුවම ඇති බිත්තියට මුහුණලා සිටින විට එහි වම්පස පහළම තීරුවත් මල් බඳුන් මෝස්තරයකින් අලංකාර කොට ඇත.

රජ පිළිමගෙයට ඇතුල්වන්නෙකුට දකුණු පසින් ඇති බිත්තිය මනහර කැටයම් වලින් අලංකාර කොට ඇත. එම බිත්තියේ මැද මිණි අක්බිත නාග දේව රාජයාණන්ගේ ප්‍රතිමාවක් දක්වා ඇත.දකුණු අතින් කඩුවක් ඉහළට ඔසවා ගෙන සිටින අයුරින් කැටයම් කොට ඇත. වම් අත පහතහෙළා ගෙන සිටී.ආභරණ වලින් විභූෂිතව සිටිනා අතර ඔටුන්නට පිටුපසින් නයි පෙණයක් දක්වා තිබේ. ඒ වටා තොරණක ආකාරයෙන් කැටයමක් ඇති අතර එහි ඉහළින් පක්ෂීන් දෙදෙනෙක් වසා සිටින ආකාරයක් දක්වා ඇත. තොරණේ පහළ සිංහයන් දෙදෙනෙක් සිටී.

එම කැටයම දෙපසින් ඔත් පිළිමගෙයට ඇතුළු විම සඳහා වන දොරටු දෙකකි. ඒ වටා මිනිසුන් දෙදෙනා බැගින් දරා සිටින පරිදි නිර්මාණය කරන ලද මකර තොරණ දෙකක් දැකිය හැක. මකර තොරණට ඉහළින් ස්ථර 2 ක සිටිනා ආකාරයට හිඳි හා හිටි ඉරියව්වලින් මල් හා ආයුධ දරා සිටින දේවාදීන්ගේ රූප හය බැගින් තොරණ දෙක අසලම දක්වා ඇත.මකර තොරණ වලට ඉහළින් හා දෙපසින් මල් දරා සිටින දේව හෝ මනුෂ්‍ය රූප දක්වා ඇත.

දොරටුවල උළුවස්ස මල් කැටයම් වලින් අලංකාර කොට ඉහළ තීරුවේ ලියවැල් සිතුවම් කොට ඇත.එම බිත්තියේ ඇති දොරටු දෙකින් දකුණු පස දොරටුවේ උළුවස්සත් මකර තොරණත් අතර ඉහළින් මිනිසුන් දෙදෙනෙක් අල්ලා සිටින ඵලකයක් වැනි යමක් ඇත. එහි " ශ්‍රී බුද්ධ වර්ෂයේ 2394 ක්වූ බිනරමස

විපසලොස්වක ලත් රවි දින මෙහි වැඩ නිම කෙරෙව්වේ ශ්‍රී කල්‍යාණි බයාධිපති මාපිටිගම සංඝරක්ඛිත තෙරුන් වහන්සේ විසින්ය'' යනුවෙන් සඳහන් කර ඇත.



වම්පස දොරටුවේ උළුවස්සත් මකර තොරණත් අතර දේවරූපයක් සිතුවම් කර ඇත.ඒ දෙපස සෙමෙර සලන්නන් දෙදෙනෙක් සිතුවම් කොට ඇත. දකුණු පස බිත්තියේ දෙකෙළවරවල් දෙකේද දේව ප්‍රතිමා දෙකක් කැටයම් කොටඇත. ඒ රූප දෙකෙන් මණි අක්ඛිත ප්‍රතිමාවට දකුණු දෙසින් ඇති ප්‍රතිමාව එනම් රජ පිළිමගෙයට ඇතුළු වීමට ඇති දොරටුවට ආසන්නයෙන්ම ඇති ප්‍රතිමාවේ වම් අතේ කඩුවක් දරාසිටින අයුරු දක්වා ඇත.

මණි අක්ඛිත ප්‍රතිමාවට වම් පසින් ඇති ප්‍රතිමාවේ දකුණු අතින් කඩුවක් දරා සිටී. ඔවුන් දෙදෙනාම උස්වූ ඔටුණු පැළඳ සිටී. පිළිම දෙක අසලම ප්‍රතිමාවත් දොරටුවත් අතර ඇති ස්ථානයේ අතින් පුන් කළසක් දරා සිටින නාග කන්‍යාවන් දෙදෙනෙක් සිතුවම් කර ඇත. දෙපස පිහිටි මෙම ප්‍රතිමා දෙකට ඉහළින් එනම් දකුණු පස බිත්තියේ ඉහළ කෙළවර වල් දෙකේ ඉර හඳ රූප සිතුවම් කොට ඇත.

මණි අක්ඛිත ප්‍රතිමාවට දකුණු පසින් ඉහළ කෙළවරේ ඉරත් වම්පස ඉහළ කෙළවරේ සඳ හා තරුත් දක්වා ඇත. මණි අක්ඛිත ප්‍රතිමාව දෙපස සෙමෙර සලමින් සිටින නාග කන්‍යාවක් හා නාග ගෝත්‍රිකයෙක් සිතුවමින් දක්වා ඇත. එම බිත්තියේ ඉඩකඩ සහිත අනෙක් ස්ථානවල රතු පසුබිමෙහි ලියවැල්, මල් මෝස්තර, පක්ෂීන් ආදිය සිතුවම් කොට ඇත.

බිත්ති 4 රේම ඉහළම තීරුව මල් මෝස්තරයක් සඳහා වෙන් කොට ඇත. වහළය මැද හා වටේ තීරුවල මල් මෝස්තර දක්වා ඇත. ඊට අමතරව මහලයේ ලග්න දොළහ, දේවරූප, පක්ෂීන්, සිංහරූප ආදිය සිතුවම් කොට ඇත.

## - අලුත් විහාර ගෙය -

රජ පිළිම ගෙයි වම්පස බිත්තියේ ඇති දොරටුවෙන් අලුත් විහාර ගෙයට ප්‍රවිශ්ට විය හැක. මෙය කැලණි විහාර මන්දිරයට අලුතින් එක්වූ කොටසයි.

අලුත් විහාර ගෙයි ධාතු කරඬුවක් තැන්පත් කොට ඇත. එම කරඬුව මණ්ඩපයක තැන්පත් කොට ඇත. මෙම අලුත් විහාර ගෙයි බිත්ති හතරේම විවිධ සිතුවම් දක්වා අලංකාර කොට ඇත. කරඬුවට පිටුපස බිත්තියේ ඉහළින්ම සිතුවම් කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩම කිරීමයි. එම සිතුවම ඇති බිත්තියේ පහළම තීරුවේ ප්‍රථම වරට පෙරහැර පැවැත්වීමද ඊට ඉහළින් කැලණි වෙහෙර පිළිසකර ඇරඹූ දෙහිගස්පේ අත්ථදස්සී හිමියන් වෙත පැමිණි මාපිටිගම උපාසකවරයා දැක්වෙන සිතුවමද වන අතර එහි ඉතිරි සිතුවම් කරඬුව සහිත මණ්ඩපයට පිටුපසින් ඇති නිසා දැකගැනීමට අපහසුය.

ධාතු කරඬුවට මුහුණලා සිටින්නෙකුට වම්පසින් ඇති බිත්තිය, එනම් රජ පිළිමගෙයි සිට ධාතු කරඬුව සහිත කොටසට පිවිසෙන්නෙකුට ඉදිරියෙන් පෙනෙන බිත්තියේ මැද ඉහළින්ම දැකිය හැක්කේ බුදුන් වහන්සේ නාගදීපයට වැඩම කිරීම දැක්වෙන සිතුවමයි.

ඊට පහළින් සිතුවම් තීරු දෙකක් දක්වා ඇත.එයින් පහළම තීරුවේ රාමඤ්ඤ භික්ෂූන් උපසම්පදා කිරීමත් පෘතුගීසීන් කැලණියේ වෙහෙර විහාර බිඳ හෙලීමත් දක්වා ඇත. ඊට ඉහළ තීරුවේ මාස කැලණි වෙහෙර බිඳ හෙලීම, 3 වන විජයබාහු වාහල් කඩක් හා වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමත් බුරුම රජ රාමාධිපති රජ දේශීය භික්ෂූන්ට පාරිශුද්ධ උපසම්පදාව පිණිස ලක්දිව වැඩමවීමට ආරාධනා කිරීම, කෝට්ටේ 3 වන බුවනෙකබාහු රජුට රාමඤ්ඤ ඇමති සන්දේශය පිළිගැන්වීම ආදිය සිතුවම් කර ඇත.

බුදුන් වහන්සේ නාගදීපයට වැඩමවීම දැක්වෙන සිතුවමට දකුණු පසින් නාරජු විසින් එවන ලද බොජුන් වළඳා, අනුමෙවෙණි බණ දේශනා කොට, දෙව්රම් වෙහෙරට වැඩමවීම දැක්වෙන සිතුවම් ඇත. එම සිතුවමට පහළින් දොරටුවක්ද දොරටුවට දකුණු පසින් සිතුවම් පහක්ද දක්වා ඇත.ඒ අතරින් ඉහළම තීරුවේ මණිඅක්ඛිත නා රජු සර්වඥයන් වහන්සේට ආරාධනා කිරීම ඊට පහළින් කැලණි වෙහෙර ප්‍රතිසංස්කරණයට කළ අයදුම ඕලන්ද අධිපතීන් පිළිනොගැනීම ආදියද ඊට දකුණු පසින් ඕලන්ද විරුද්ධත්වය නොසලකා විහාරයේ වාසය කිරීමට තෙරනමක් මහනුවරින් වැඩම කිරීමත් පහළම තීරුවේ මාපිටිගම ධම්ම රක්ඛිත ස්වාමීන්ද්‍රයන්ගේ ඉල්ලීම අනුව ඇතුළු විහාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා හෙලේනා විජේවර්ධන මැතිණිය මංගල ගල ප්‍රතිෂ්ඨාපනය කිරීම, ඊට දකුණු පසින් ධාතු කරඬුව වැඩමවීම දක්වා ඇත.

එම බිත්තියේ නාග දීපය දැක්වෙන සිතුවමට වම්පසින් බුදු රජාණන් වහන්සේ දෙවියන්ට ධර්ම දේශනා කොට මහ සමන් දෙව් රජුට කේශ ධාතු මිටක් දී උරුවෙල් දනව්වට වැඩම කිරීම සිතුවමෙන් දක්වා ඇත. ඊට පහළින් යකුන් ගිරි දිවයිනට පිටිසීම දක්වා ඇත. එතැන ඇති කුඩා දොරටුවටවම්පසින් පහළ තීරු දෙකේ කැලණිතිස්ස රජු කැලණිතිස්ස තෙර හා බැඳුණු පුරාවෘත්ත සම්බන්ධ සිතුවම් දැකිය හැක.

ධාතු කරඬුව ඉදිරිපිට ඇති බිත්තිය එනම්, ඇතුළුවීමේ දොරටුවෙන් පිවිසෙන්නෙකුට වම්පසින් ඇති බිත්තියේ ඉහළින්ම බුදු රජාණන් වහන්සේ මහියංගණයට වැඩමවීම සිතුවමින් දක්වා ඇත. ඊට පහළ තීරු දෙකේද පුරාවෘත්තය හා සම්බන්ධ සිතුවම් දක්වා ඇති අතර ඒවා පසුව පිළිවෙළින් දක්වා ඇත.

අලුත් විහාර ගෙයට ප්‍රවිෂ්ට වීමට දොරටු සහිතවූ බිත්තිය එනම්, ධාතු කරඬුවට මුහුණලා සිටිනෙකුට දකුණු පසින් ඇති බිත්තියේ ඉහළම මැද දක්වා ඇත්තේ බුදු රජාණන් වහන්සේ පාද ලාංඡනය පිහිටුවීමයි. එම සිතුවමට වම්පසින් ඉහළම තීරුවේ දෙව්බඹුන්ගෙන් පූජාසත්කාර විඳිමින් සමනොළට වැඩම කිරීම දක්වා ඇත. ඊට පහළින් බුදුරදුන් ප්‍රමුඛ සංඝයාට මණිඅක්ඛිත නා රජු ආහාර පිළිගැන්වීම දක්වා ඇත.

එම සිතුවමට දකුණු පසින් සමන් දෙව්රජ සමනොළට වැඩම වන සේ සර්වඥයන් වහන්සේට ආරාධනා කිරීම දක්වා ඇත. ඊට පහළින් ප්‍රවේශ දොරටුව ඇති අතර දොරටුවට දකුණු පසින් එනම්, මණි අක්ඛිත රජු දන් පිළිනැම්ම දැක්වෙන සිතුවමට යටින් පසේ බුදුන්ට මී පිළිගැන්වීම, මී සල්පිළට මග දැක්වූ සටවෙම්කාව , තුන් බෑ වෙළඳුන් එක්ව අය වැය පරීක්ෂා කිරීම දක්වා ඇත.

එම සිතුවම් පෙළට යට තීරුවේ චක්‍රවර්තී ධර්මාශෝක රජ හා දෙවි ආසාධිමිත්‍රාව, දේවතානුග්‍රහය ලද සුමනාව, නිග්‍රෝධ කුමරුන්ගේ බාල අවස්ථාව, ලක්දිව උපන් දෙවන පැතිස් රජ සිතුවම් කොට ඇත.ප්‍රවේශ දොරටු දෙක අතර මැද කොටසේ පාද ලාංඡනය දැක්වෙන සිතුවමට පහළින් තිස්ස රජු බුදු සසුන්හි පැහැදවීම, තෙරුන් අධිකාරය විචාරීම, මහ මිහිඳු තෙරුන් අග නුවරට වැඩමවීම, මහ මෙව්නා උයන පිළිගැන්වීම, සිරිමා බෝ පිහිටුවීමද ඊට පහළ තීරුවේ මහා නාග යුවරජ නැසුමට කළ උපාය, බියපත් යුවරජ සිය පිරිස ගෙන මාගම්පුරය බලා නික්මීම, යටාලතිස්ස කුමාරෝත්පත්තිය, යටාලතිස්ස රජ විසින් කරවන ලද කැලණි වෙහෙර ආදී සිතුවම් ඇත.

පාද ලාංඡනය දැක්වෙන සිතුවමට දකුණු පසින් එනම්, දොරටුවට ඉහළින් සිතුවම් දෙකක් දැක්වේ. ඉහළ සිතුවම සංඝයා සහිත තථාගතයන් වහන්සේ සමනොළ පර්වත පාදයෙහි (දිවාගුහාව) දිවා විහරණය කොට දිගා වැවට වැඩම වීම දක්වා ඇත.

ඊට පහළින් දිගා වැව ආදී සිද්ධස්ථානයන්හි සමාධි සුවයෙන් වැඩහිඳ දෙව්රම් වෙහෙරට වැඩමවීද සිතුවම් කොට ඇත. ඊට පහළින් ගෝඨාභය රජ කැලණි නුවර රාජ්‍ය කිරීම, කැලණි පුර සිහසුන කැලණිතිස්ස කුමරුට පවරා රුහුණු රජය පිණිස ගෝඨාභය රජ මාගම්පුරය බලා නික්මීම, කැලණිතිස්ස හා උත්තිය කුමරුවන්ගේ අකුරු උගැන්ම, කැලණිතිස්ස තෙරණුවන් පිඬු පිණිස රජ ගෙට පිවිසීම, උත්තිය කුමරු හා බිසවගේ විෂමාචාරය දත් රජ කිපී ඔහුට නිග්‍රහ කරවයි අණ කිරීම ආදිය දැක්වේ.

එම කතාවට අදාල ඉතිරි කොටස මහියංගණ දැක්වෙන සිතුවමට පහළින් සිතුවම් කොට ඇත. එනම්, හයින් කුමරු පලායාම, බිසවට රහස් පත්දී මහණ වෙස්ගත් මිනිසෙකු යැවීම, ඔහු කැලණිතිස් තෙරුන් හා රජගෙට පිවිසීම, සොර මහණ රහස්පත බිම හෙළීම සහ පසු ගමන් කළ රජු ඒ හඬ ඇසීම ආදියයි. එහි ඉතිරිය ඊට යාබදව ඇති බිත්තිය එනම්, නාගදීපය දැක්වෙන බිත්තියේ දක්වා ඇත.



ඒ අතර රහස් පත ගෙන බලා “මේ සොරා මා බිසවට පත් එව්යයි” රජ කිපී නිවැරදි තෙරුන්ට වධ පිණිස අණ කිරීමත් වධකයන් හා ගමන් ගත් කැලණිතිස් දැක්වෙන සිතුවම්ද ඇත.

නැවත ඉතිරි කොටස මහියංගණය දැක්වෙන සිතුවම සහිත බිත්තියේ පහළම තීරුවෙන් දක්වා ඇත. එහිදී කැලණිතිස් තෙරුන් උණු තෙල් සැලෙහි ධ්‍යාන සුවයෙන් වැඩහිඳීම, ඇමතියන්ගේ ධර්මාවවාද අසාත් කිපී රජ සන්තෝෂ නොවීම, දේව කෝපයෙන් කෙත්වතු ගම් නියම්ගම් යට කෙරෙමින් මුහුද ගැලීම ආදියද එහි ඉතිරිය නැවත නාගදීපය දැක්වෙන බිත්තියේ පහළම තීරුවේද වේ. එහි සමුද්‍ර දේවතාවන්ට මේ බිලිය මැයි මුලාවූ කැලණිතිස් දූ කුමරිය මූදෙහි පා කොට හැරීමත් ඒ දූ කුමරිය කාවන්තිස්ස රජ මෙහෙසි බැව්හි අභිෂේක කිරීමත් සිතුවම් කොට ඇත.

අලුත් විහාර ගෙයි බිත්ති හතරේම යටම තීරුව පුන් කළස් සහිත මෝස්තරයකින්ද අධම තීරුව ලියවැල් මෝස්තරයකින්ද අලංකාර කොට ඇත. වහලයේ මල් මෝස්තර දක්වා ඇත.

## - ඔත් පිළිම ගෙය -

රජ පිළිම ගෙයින් ඔත් පිළිම ගෙයට පිවිසීම සඳහා දොරටු දෙකක් ඇත. රජ පිළිම ගෙයි දකුණු පස බිත්තියේ මෙම දොරටු දෙකම සාදවා ඇත.

ඔත් පිළිම ගෙය මෙම විහාරයේ පුරාණතම කොටසයි. මෙහි සැතපෙන ඉරියව්වෙන් නෙළා ඇති රන් පැහැති ප්‍රතිමාව මහ නුවර යුගයට අයත් යැයි සැලකේ. සිරස්පතක්ද සහිතව නෙළා ඇති ප්‍රතිමාව රැස් මාලාවක්ද සහිත වන අතර සිවුර රැළි සහිතව නෙළා ඇත.

බුදු පිළිමයේ හිස දෙසින් හිඳ බුදු පිළිම දෙකකි. එකක් අනෙකට වඩා තරමක් කුඩාය. සිවුරේ රැළි දක්වා ඇති ආකාරයද වෙනස්ය. පිළිම දෙක අතර කුළුණක් මත පුන් කළසක් තබා ඇති ආකාරය දැක්වෙන සිතුවමක් ඇත. පිළිම දෙක දෙපස පිළිම වලට වන්දනා කරන ආකාරයෙන් සිතුවම් කොට ඇති රහතන් වහන්සේලාගේ චිත්‍ර ඇත.

බුද්ධ ප්‍රතිමාවට පිටුපසින් ඇති බිත්තියේත් දෙපස බිත්ති දෙකේත් ඉහළම තීරුවේ සූවිසි බුදු වරුන්ගේ සිතුවම් දක්වා ඇත. බුදු පිළිම දෙකක් අතර අදාල රජුගේ රූපය දක්වා ඇත. බුද්ධ රූප හා රජ රූප වලට පහළින් ඔවුන්ගේ නම් සඳහන් කොට ඇත.

බුද්ධ ප්‍රතිමාවට පිටුපසින් ඇති බිත්තියේ ඉහළම තීරුවට පසු පහළින් තීරු දෙකක්ද ඒ ඉදිරිපිට ඇති බිත්තියේ එනම්, ප්‍රවේශ දොරටු සහිත බිත්තියේ ඉහළ සිට තීරු තුනක්ද දෙපස බිත්ති දෙකෙන් ඔත් පිළිමයේ හිස පෙදෙසේ ඇති බිත්තියේ ඉහළම තීරුවට පහළින් ඇති තීරු දෙකක් හා ඔත් පිළිමයේ පාද දෙසින් ඇති බිත්තියේ එක් තීරුවක් හා ඊට පහළින් ඇති තීරුවේ කුඩා ඉඩකද රහතන් වහන්සේලාගේ සිතුවම් දක්වා ඇත.

## - රන් පිළිම ගෙය -

විහාර ගෙයට ඇතුළු වන්නෙකු ඉදිරියෙන් කෙළින්ම පෙනෙන රන් පැහැ පිළිමය සහිත කොටස රන් පිළිම ගෙය නමින් හැඳින්වේ. රන් පිළිම ගෙයට ඇතුළුවීම සඳහා වන සඳකඩ පහන සහිත දොරටුවත් නැවතත් ඇති ගල් උළුවස්ස සහිත දොරටුවත් අතර ඇති බරාඳ කොටසේ සිතුවම් අතර, සඳකඩ පහන සහිත දොරටුවට ඉහළින් ඇති බිත්තියේ ලක්සසුන පිහිටුවීමට අනුරාධපුර මහා සීමාව බැඳීම හා ඒ දෙපස විජය කුමරු ලක්දිවට ගොඩ බැසීම හා අළු විහාරයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් දක්වා ඇත.

ගල් උළුවස්සට ඉහළින් ඇති බිත්තියේ බුදුන් පිරිනිවන් පෑමේදී ලක් සසුන රැකුමට ලත්වර සක්දෙව්දු උපුල්වන් දෙව්දුට පැවරීමත් , ඊට පහළින් වැලිවිට සරණංකර හිමියන්ට කීර්ති ශ්‍රී රාජසිංහ රජු සංඝරාජ පදවිය පිරිනැමීමත් බුද්ධඝෝෂ හිමි අටුවා පිරිනැමීමත් දැක්වේ. ගල් උළුවස්සේ ආරම්භයේ පෙණ පහේ නාගයාගේ කැටයම හා එතැන් සිට ඉහළට ලියවැල් මෝස්තරයකුත් දෙපසින්ම නෙළා ඇත. ගල් උළුවස්සේ ඉහළ බුදුරජාණන් වහන්සේ නාග ගෝත්‍රිකයින්ට ධර්මදේශනා කිරීම දක්වා ඇත.

එම කොටසට පසුව රන් පිළිමය වැඩ හිඳින කොටසට පෙර තවත් කොටසක් දක්නට ලැබේ. රන් පිළිමයට ප්‍රථමයෙන් මෙම කොටසේ ඇතුළුවීමේ ප්‍රධාන දොරටුවට අමතරව දෙපසේ ඇති බිත්ති දෙකේද කුඩා දොරටු දෙකක් ඇත. එහි ප්‍රධාන දොරටුව අසල රන් පිළිමයට මුහුණලා සිටින්නෙකුට දකුණු පසින් ඇති දොරටුවට ඉහළින් සිදුහත් කුමාරෝත්පත්තිය දක්වා ඇත.

ඇතුළුවීමේ ප්‍රධාන දොරටුවට ඉහළින් බුද්ධත්වයට පත්වීමත් වම්පස ඇති බිත්තියේ දොරටුවට ඉහළින් පරිනිර්වාණයත් දක්වා ඇත. එම කොටසේ බිම නෙළුම් මල් මෝස්තර සහිත වන අතර වමළයේ රාත්‍රී අහස දැක්වෙන පරිද්දෙන් තරු සහිතව නිර්මාණය කොට ඇත. එම කොටසේ ඇති කුළුණු වල නළා, බෙර, තාලම් ආදිය වයන වාදකයන්ගේ රූපද සත්ත්ව රූපද දක්වා ඇත.එහි දකුණු පස ඇති දොරටුවෙන් ගියවිට ඉදිරියෙන් දක්නට ලැබෙන්නේ හේමමාලා හා දන්ත කුමරු දළදා වහන්සේ ගෙන ලක්දිවට පැමිණෙන සිතුවමයි.

එම සිතුවම දෙපස වා කවුළු වලට ඉහළින් දන්ත ධාතූන් වහන්සේ පෙළහර පානා අවස්ථා සිතුවම් කොට ඇත. එතැනට ඇතුළු වන දොරටුවට ඉහළින් දන්තධාතූන් වහන්සේ විනාශ කරන්නට මිත්‍යාදෘෂ්ඨිකයන් උත්සාහ දැරූ අන්දම සිතුවමින් දක්වා ඇත. ඊට පිටත කොටසේ ඇතුළුවන දොරටුවට ඉහළින් ඡන්න හා

කන්ථක උත්පත්තිය දක්වා ඇත. එම සිතුවමට දකුණින් සොත්ථිය බමුණා කුසතණ පිදීමත්, වමින් සුජාතාව කිරිපිඬු පිළිගැන්වීමත්, ඉදිරියෙන් තුසිත බෝසත් දෙව් පස්මහ බැලුම් බැලීමත් චිත්‍රණය කොට ඇත. වහළයේ මල් මෝස්තර දක්වා ඇත.

රන් පිළිමය වැඩ හිදිනා කොටසට පෙර ඇති කොටසේ වම්පස ඇති දොරටුවෙන් ගියවිට ඉදිරියෙන් දක්නට ලැබෙන්නේ සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම දැක්වෙන සිතුවමයි. එම සිතුවමට දෙපස වා කවුළු වලට ඉහළින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ පෙළහර පානා අවස්ථාවක් හා බෝධීයට ගෞරව සත්කාර කරනු ලබන අවස්ථාවක්ද ඇතුළුවන දොරටුවට ඉහළින් භික්ෂුනී ශාසනය පිහිටුවීමද සිතුවම් කොට ඇත.

ඊට පිටත කොටසේ ඇතුළුවන දොරටුවට ඉහළින් බෝසතුන් පාසලේ ඉගෙනීමත් එම සිතුවමට දකුණින් කාල දේවල ඍෂි බෝසතුන් වැඳීමත් වමින් බෝසතුන් පළමු සමවැදීමත් ඉදිරියෙන් මහමායා දේවිය දුටු සිහිනයත් දක්වා ඇත.

රන් පිළිමය ඇති කොටසට ඉදිරියෙන් අලංකාර ලෙස කැටයම් කර ඇති මකර තොරණක් දැකිය හැක. ඊට පසුව හිඳි ඉරියව්වෙන් වැඩ හිඳිනා රන් පිළිම වහන්සේද එය පසු පස සුදුවන් හිම කන්දක සිතුවමක්ද ඇත.

# කැලණි පෙරහැර

1925 දී ආරම්භ කෙරුණු කැලණියේ දුරුතු පෙරහැර එකල හැඳින්වූයේ ධාතු පෙරහැර නමිනි.

දුරුතු පුර පසළොස්වක පොහෝ දිනයේදී ධාතු කරඬුව හා අලි ඇතුන් සමග නර්තන කණ්ඩායම් කිහිපයක්ද එක්රැස් කර ගනිමින් පෙරහැර ආරම්භ කෙරිණි. මෙහිදී විහාරාධිපති ධම්මරක්ඛිත හිමියන් සමග ජේ. ආර්. ජයවර්ධන, වෝල්ටර් විජයවර්ධන, ඩී. සී. විජයවර්ධන ආදී දායක මහතුන් සමග ගම්මුලාදෑනිවරු තිස් හය දෙනෙක් මූලිකත්වය ගෙන කටයුතු කළහ.

පෙරහැර ආරම්භ කළ දිනය සාමාන්‍ය සෞම්‍ය කාලගුණයකින් යුතුවිය. පෙරහැර වීදි සංචාරය කිරීම ආරම්භ කොට මද දුරක් ගෙවී ගිය පසු අනපේක්ෂිත අයුරින් මහ වැස්සක් පතිත විය. පෙරහැර පැවැත්වීම අසාර්ථක වූ බැවින් පිරිස පෙරලා විහාරයට පැමිණියහ. එම සිද්ධිය අසුභ නිමිත්තක් ලෙස කවුරුත් සැලකූහ.

ඒ අනුව ගුප්තවිද්‍යාව පිළිබඳ ප්‍රසිද්ධ ශාස්ත්‍රඥයෙක් හමුවීමට ගිය විහාරාධිපති හිමියන්ට දැන ගන්නට ලැබුණේ කැලණියේ විභීෂණ දෙවියන්ගේ රන් කඩුව කැලණියේ නොමැති බැවින් එය නැවත විභීෂණ දේවාලයට භාර කරන තෙක් පෙරහැර පැවැත්විය නොහැකි බවයි. එය ගාල්ලේ චීන කොරටුව පන්සලේ ඒ වන විට තිබෙන බවත් පවසා තිබුණි. විහාරාධිපති හිමියන් ඒ පිළිබඳ සොයා බලා කඩුව දේවාලයේ නොමැති බැවින් චීන කොරටුව පන්සලට ගියේය. ඒ වන විට කපු මහතෙක් විසින් කඩුව පන්සලට උකස් කර මුදල් ලබාගෙන තිබිණි. කැලණි විහාරාධිපති හිමියන් එම මුදල් ලබාදී කඩුව නැවත පවරා ගෙන එය කැලණියේ විභීෂණ දේවාලයේ තැන්පත් කළේය.

1925 ධාතු පෙරහැර නමින් ආරම්භ කෙරුණු පෙරහැරට විභීෂණ දේවාලයද, ඉන්පසු විෂ්ණු , කතරගම දේවාලවල පෙරහැරවල්ද එකතු වී විශාල පෙරහැරක් වශයෙන් 1927 සිට නිල ලෙස ආරම්භ කෙරිණි. දේවාල පෙරහරේදී දේවාභරණ වශයෙන් දේවායුධ වැඩම කරවනු ලබයි.

විභීෂණ දේවාල පෙරහැරේ රන් කඩුවද විෂ්ණු දේවාල පෙරහැරේ ඊයද කතරගම දේවාල පෙරහැරේ වේලායුධයද වැඩම කරවනු ලබයි. පසුකාලීනව දේව ප්‍රතිමාවන්ද පෙරහැරේ වැඩම කරවීමට කටයුතු සම්පාදනය කෙරිණි. ඒ අනුව සඳුන් ලීයෙන් තනවන ලද විභීෂණ දේව ප්‍රතිමාවක්ද මූණමල් ලීයෙන් තනවන ලද විෂ්ණු දේව ප්‍රතිමාවක්ද රත් කිහිරිය ලීයෙන් තනවන ලද කතරගම දේව ප්‍රතිමාවක්ද පෙරහැරේ වඩම්මනු ලබයි.

ආරම්භක අවධියේ  ඉතා දීර්ඝ ගමන් මාර්ගයක ගමන් කරනු ලැබූ අතර එනිසාම පෙරහැර ගමනාන්තය කරා ළඟා වන්නේ ඉතා අපහසුවෙන් හා වෙහෙසාධීක තත්ත්වයකිනි. එම නිසා පෙරහැර ගමන් ගන්නා මාර්ගය වෙනස් කිරීමට සිදුවිය. වර්තමානයේ පෙරහැර විහාරය වටා ගමන් කිරීමක් සිදුවේ.

දිවයිනේ පවත්නා පෙරහැරවල් අතරින් අති උත්කර්ෂවත් වූ පෙරහැරක් වශයෙන් සැලකෙන කැලණි පෙරහැර විවිධ සම්ප්‍රදායන්ට අයත් නැටුම් හා අලිඇතුන්ගෙන් අලංකාරවත් වී ඇත. නමුත්, කැලණි පෙරහැරේ නැටුම් අංග සඳහා කාන්තාවන් සම්බන්ධ කර නොගන්නා අතර එය අතීතයේ පටන් අද දක්වාම සිදුකෙරේ. කැලණි පෙරහැර විශාල ජනකායකගේ සහභාගීත්වයෙන් දින 3 ක් පුරා පැවැත්වේ.

# කැලණි වෙහෙරේ ඓතිහාසික විකාශය

කැලණි වෙහෙර ගොඩනැගුවේ මණි අක්ඛිත නාරජුය. මැණික් පුටුවක් නිධන් කොට එය තනා ඇත. මණි අක්ඛිත රජුගෙන් පසු දෙවනපෑතිස් රජුගේ සොහොයුරු උත්තිය කුමරු කැලණි වෙහෙර අලුත් වැඩියා කොට දියුණු කරවූ බව සඳහන් වේ. එසේම යටාලතිස්ස රජු කැලණියේ පස්මහල් ප්‍රාසාදයක් තැනවූ බවත් දුටු ගැමුණු රජු කැලණිය සමග සම්බන්ධතා පැවැත්වූ  බවත් සඳහන්ය.



ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවසේ රාජ්‍ය කරනු ලැබූ කනිට්ඨ තිස්ස රජු විසින් කැලණි විහාරයේ පෝය ගෙයක් නැතිනම් උපෝසථාගාරයක් ඉදිකරවූ බව කියවේ. පොළොන්නරු යුගයේ රජවරුන් වන මහා පරාක්‍රම බාහු රජතුමා හා නිශ්ශංක මල්ල රජතුමා කැලණිය සමඟ සබඳතා පැවැත්වූ බවට තොරතුරු ඇත.

එනම්,පරාක්‍රම බාහු රජුගේ යුධ කඳවුරක් කැලණියේ පැවති බවත් නිශ්ශංක මල්ල රජු කැලණි වෙහෙර වන්දනා කිරීමට පැමිණි බවත් සඳහන්ය. කැලණි විහාරය කාලිංග මාඝ සිදුකළ ආක්‍රමණ නිසා විනාශ විය. 3වන විජය බාහු රජු විනාශ වී තිබූ කැලණි චෛත්‍යය ප්‍රතිසංස්කරණය කොට එයට රන්කොතක් හා වාහල් කඩක් ද තනවා එහි වූ පිළිම හා බුදු මැදුර ආදිය ප්‍රතිසංස්කරණය කළ බව මහාවංශයේ සඳහන්ය. ඔහු පුත් දෙවන පරාක්‍රම බාහු දිනපතා විහාරයට පහන් පූජා සිදුකිරීම සඳහා අවශ්‍ය පොල් උයනක් විහාරයට පූජා කළ බවත් මහාවංශයේ සඳහන්ය.

ඉන්පසු 1505 දී පෘතුගීසින් මෙරටට පැමිණි අතර ඉන්පසු කැලණියේ දුර්භාග්‍ය කාලය උදාවිය. කෝට්ටේ රජු හා කැලණි විහාරය අතර තිබුණු දැඩි සම්බන්ධය නිසා කැලණි විහාරය තමන්ට තර්ජනයක් විය හැකි බව වටහාගත් පෘතුගීසිහු කැලණි විහාරයට පහර දුන්හ. දියෝගෝ ද මේලෝ නම් පෘතුගීසි කපිතාන්වරයා මෙහෙය වූ මෙම පහරදීමට විරුද්ධ වු සිංහල බෞද්ධයින් කැලණි ගඟේ ගිල්වා මරාදැමූ බව සඳහන්ය.

ජනප්‍රවාදයන්ට අනුව පෘතුගීසින් කොළඹ කොටුව තනා ඇත්තේ කැලණි විහාරයේ තිබූ ගල් ගඩොල් ආදියෙනි.

දොන් ජුවන් ධර්මපාල කුමරු 1591 ජනවාරි 19 වනදා කැලණිය පෘතුගීසින්ට පැවරීය. කැලණි විහාරයට අයත්ව තිබූ ගම්බිම් දේපල ආදිය 1555 වර්ෂයේ පමණ රෝමානුකතෝලික ආගමේ 'ෆ්‍රැන්සිස්කන් ' නිකායට අයත් පූජකවරුන්ට පවරා දුන්නේය. පෘතුගීසී පාලනය යටතේ අවුරුදු 100 ක් පමණ පැවති කැලණි පුද බිම එම කාලසීමාව තුළ නටබුන්ව ගියේය.

1658 න් පසු ලංකාව පෘතුගීසින්ගෙන්, ලන්දේසීන් අතට පත්විය. ඔවුන් 1682 දී බුද්ධාගම ඇදහීම තහනම් කරනු ලැබිය. 1692 දී කැලණි විහාරයේ බුද්ධාගම ඇදහීම තහනම් කරනු ලැබීය.

1699 දී එක් භික්ෂූන් වහන්සේ නමක් ධාතු කරඬුවක් සමග දවුල් කරුවන් සිව්දෙනෙක් හා සේසත් තුනක්ද ගෙන තවත් පිරිසක්ද සමග පැමිණ කැලණි විහාරයේ පදිංචි වූහ. ලන්දේසි ආණ්ඩුකාරවරයා ඒ පිළිබඳ සොයා බලා ඔවුන් එතැනින් ඉවත් කළහොත් සිංහල රජු අසතුටු වන නිසා මේ මෝසමට පමණක් තහනමක් නොමැතිව එහි ඉන්නට ඉඩලබා දුන්නේය.

1750 දී මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා නිලමෙවරුන්ද භික්ෂූන්ද එක්ව කැලණි විහාරය නැවතත් තමන්ගේ භාරයට ගැනීමට උපායක් යෙදූහ. එනම්, එක් නායක භික්ෂූන් වහන්සේ නමක් අසනීපෙන් සිටින බව පවසා උන්වහන්සේ ඒ සඳහා ප්‍රතිකාර ගැනීමට පැමිණෙන බැවින් කැලණි විහාරයේ නැවතී සිටීමට ඉඩ ලබා දෙන ලෙස ඉල්ලා හසුනක් පිළියෙල කළෝය.

නායක හිමි නම හා භික්ෂූන් වහන්සේලා තිහක පමණ පිරිසක්ද කැලණි විහාරයට වැඩම කළ අතර උන්වහන්සේලා පරීක්ෂා කළ ලන්දේසි දොස්තර උන්වහන්සේලාට අසනීපයක් නොමැති බව පැවසූ අතර වෛද්‍ය ප්‍රතිකාර අනවශ්‍ය බව පැවසීය. මෙසේ උන්වහන්සේලාට කැලණි විහාරයේ නවාතැන් ගැනීමට ඉඩ නොලැබිණි.

1780 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු නටබුන් වූ කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කිරීමට අවසර ඉල්ලා නිලමේ කෙනෙකු අත සන්දේශයක් යැවීය. මෙම ඉල්ලීම අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂප කිරීමට නොහැකිව සිටි ලන්දේසි බලධාරීහු රජුට විරුද්ධවීම අවාසි සහගත බැවින් අකමැත්තෙන් වුවද ඊට අවසර දුන්හ. එතැන් සිට කැලණිය නැවතත් සංවර්ධනය විය.

1796 ලන්දේසි පලවා හැර මෙරට පාලන බලය ලබා ගත් ඉංග්‍රීසිහු ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් ගෙන ගියහ. ඒ අනුව කැලණි විහාරයේ සංවර්ධනය දිගින් දිගටම සිදුවිය. ඉංග්‍රීසින් තම ආගම වූ කතෝලික ආගම වැළඳගත් ස්වදේශිකයින්ට විශේෂ වරප්‍රසාද ලබා දුන් නමුත්, බෞද්ධයින්ට හිරිහැර නොකළහ. පසු කාලීනව කැලණිය හා අවට ගම්වල කතෝලික ආගම පැතිරී ගියද කැලණි විහාරයට දායක දායිකාවන් හිඟනොවිණි.

1797 පෙබරවාරි 7 වන දින ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයෙකු වූ හැරින්ටන් විසින් කැලණි විහාරය පිළිබඳ වාර්තා තබා ඇත. එහි විහාර ගෙය, බුදු පිළිම, සිතුවම්, දාගැබ් හා භික්ෂූන් පිළිබඳ විස්තර කරන ඔහු ඒ වන වට කැලණි චෛත්‍යය අඩි 60ක් උස්වූ බවත් එහි බුද්ධ රූප විස්සක් නිධන් කොට පස්මැටි ආදියෙන් තනා වටේට ගඩොල් අල්ලා ඇති බව සටහන් කොට ඇත.

# කැලණි පූජාවලිය

කැලණි පූජාවලිය ලෙස හඳුන්වන්නේ කැලණි උත්පත්ති කතාව සඳහන් වන පුස්කොළ පොතයි. එහි අන්තර්ගත වන්නේ පැරණි කථාවකි. එනම්, දීපංකර බුදුන්ගේ සමයේ සිංහල දේශයේ තිබුණු ‘ගංගාතිලක’ නම් රාජ්‍යයේ ‘දොන් දිමික’ නම් රජ කෙනෙක් රාජ්‍ය කළේය.

තම නුවර පිළිබඳ ආඩම්බරවුණු රජු දඹදිව සියලු රාජ්‍යයන්ට වඩා තම ගංගාතිලක නුවර ඉසුරුමත් බව කියා සිටියේය. එනිසා කෝපයට පත් දෙවිවරු එම රාජධානිය මුහුදට යට කරවූහ.තම රාජධානිය බේරා ගන්නට රජු විහාරයක් ඉදිකරවන්නට උත්සාහ කළමුත් එක් සෘෂිවරයෙක් ඊට හරස් විය.

කෝපයට පත් රජු සෘෂිවරයා මරන්නට නියෝග කළ නමුත්, එසේ කිරීමට නොහැකි වූ අතර රජුගේ ඔටුන්නද විනාශ විය. රජු පස් එකතු කොට වෙහෙර සෑදීමට තැත් කළද එයද අසාර්ථක විය. පස්ගොඩ ආරක්ෂා කිරීමට මුර භටයින් යෙදුවද එය අතුරුදහන් විය.

මහා වර්ෂාවක් වැටෙමින් පැවති අවස්ථාවක ‘මැණික්මායා’ රහතන් වහන්සේ රජ මාළිගයට වැඩිය අතර වැහි බිඳු උන්වහන්සේගේ පාත්‍රයටද වැටිණි. ඒ සමගම වර්ෂාව නතර වූ අතර පාත්‍රයට වැටුණු වැහි බිඳු මැණික් කැට බවට පත් විය. රහත් තෙර එම මැණික් පාත්‍රය රැගෙන පූර්ණදේශයේ සච්චපලු නුවර වැඩසිටි දීපංකර බුදුන් වෙත ගොස් එය පූජා කොට මනුෂ්‍ය ලෝකයේ ගංවතුර නවතාලීමට වඩින ලෙස ආරාධනා කළසේක.



ඒ අනුව සිංහල දේශයට වැඩම කළ බුදුන් වහන්සේ එහි සිටි දෙවි කෙනෙකුට රන් පාත්‍රයක් ලබා දී එහි වූ රන් ගල් ගුහාවක ඇති, කලින් සිටි බුදුන් වහන්සේලාගේ හැටදාහක් පමණ ධාතු එක්රැස් කරන ලෙස වදාළහ.එම ධාතු ලබාගෙන දෙවියන්ට පින් දුන් බුදුන් වහන්සේ රජු වෙහෙර ඉදිකරන්නට සූදානම් වූ ස්ථානයට වැඩි සේක. එතැන් සිටි රහතන් වහන්සේ නමක් දිව්‍ය ලෝකයට ගොස් මනුෂ්‍ය ලෝකයේ වැස්ස හා ගංවතුර නවත්තන්නට මනුෂ්‍ය ලෝකයට යන ලෙස පැවසුවත් දෙවියන් එය ප්‍රතික්ෂේප කළහ.

වසවර්ති මාරයා මහා කුණාටුවක් ඇති කොට වෙහෙර ඉදිකරන්නට නියමිතව තිබූ ස්ථානයේ මාලුන් පිරුණු පොකුණක් ඇති කළේය. නමුත් මහී කාන්තාව භූමිකම්පාවක් ඇති කොට පොකුණ සන්සින්දවා එක් ඇඟිල්ලකින් පොළව ඔසවා වෙහෙර තනන්නට අවසර දුන්පසු මුළු රටේම මහනෙල් මල් පිපුණි. ධාතූන් වහන්සේලා සහිත පාත්‍රය තැන්පත් කොට වෙහෙර ඉදි කළ අතර එහි රන් කොත් පළඳවා කටයුතු අවසන් කිරීමට වසර 12 ක් ගතවූ බව සඳහන්ය.

මෙම තොරතුරු අනුව මේ ගංගාතිලක නුවර කැලණිය විය හැකි බවත් ගංගාතිලක විහාරය කැලණි විහාරය බවත් සිතිය හැක. තවද එම මතය සනාථ කරවන තවත් තොරතුරු එහිම අන්තර්ගතය. එනම්, චූලෝදර, මහෝදර, නාරජුන් අතර ඇතිවූ යුද්ධය පිළිබඳවද එහි සඳහන්ය.

ඒ අනුව කැලණි පූජාවලියෙන් කියවෙන්නේ කැලණියේ උත්පත්ති කතාව බව පැහැදිලිය.

# කැලණිය මුහුදට යටවීම හා බැඳුණු පුරාවෘතය

කැලණියේ කැලණි තිස්ස රජු රාජ්‍ය කරන කාලයේ රජුගේ බිසවත් රජුගේ බාල සොයුරාත් අතර අනියම් ප්‍රේම සම්බන්ධයක් පැවතිණි. රජුගේ සොයුරා වූ උත්තිය කුමරු ඒ වන විට යුවරජ තනතුර දැරූ අතර ඔවුන්ගේ සම්බන්ධය රජතුමාටද සැළ විය. ඒ අනුව උත්තිය කුමරු සිරභාරයට ගන්නට රජු අණ කළද කුමරු ඒ වන විටත් පලා ගොස් තිබිණි.

උත්තිය කුමරු වෙස් වලාගෙන සැඟවී සිටියේය. ඒ අතර ඔහුට බිසවගේ තොරතුරු දැනගන්නට අවශ්‍ය වූ බැවින් තමාට හිතවත් සේවකයෙකු කැඳවා ඔහුට මහණ වෙස් ගන්වා අවශ්‍ය තොරතුරු දැන්වීය. බිසවට යවන හසුන රජු අතට පත් වුවහොත් මහා ව්‍යසනයක් සිදු විය හැකි බව වටහාගත් උත්තිය කුමරු තමාට ශිල්ප ශාස්ත්‍රය ලබා දුන් මහා තිස්ස තෙරුන්ගේ අත් අකුරු වලට සමාන අත් අකුරු වලින් හසුන සකස් කළේය. එවිට යම් හෙයකින් රජු හසුන දුටුවහොත් එය මහා තිස්ස තෙරුන් විසින් ලියණු ලැබූ යම් හසුනක් යැයි සිතනු ඇත.

මහා තිස්ස තෙරුන් වහන්සේ ඇතුළු තෙරවරු දන් වැළඳීම සඳහා රජගෙට වැඩියහ. මහණ වෙස් ගත් හසුන රැගත් පුද්ගලයාද ඒ සමග රජගෙට ඇතුළු විය. දන් වැළඳීමෙන් අනතුරුව රජගෙයින් පිටතට වඩිද්දී හසුන රැගත් පුද්ගලයා බිසවට පමණක් පෙනෙන ලෙසට හසුන බිම හෙළීය. එය පොළවේ පතිත වන හඬ ඇසූ රජු, හසුන දැක පරීක්ෂා කර බලා තිස්ස තෙරුන් විසින් ලියන ලද්දක් යැයි සිතා කෝපයට පත් විය.තම බිසවට පෙම් පත් ලියූ වරදට තෙරුන් වහන්සේ තෙල් කටාරමක බහා ගිණිගසා මරන්නට නියෝග කළේය.

වදකයෝ තෙල් කටාරම සකසා ගිනි ගසා තෙල් කකියද්දී මහා තිස්ස තෙරුන්ව එයට බැස්වූහ. උන්වහන්සේ ඒ වන විටත් රහත් බව ලබාසිටි බැවින් කිසිදු ශරීර හානියක් සිදු නොවී තෙල් කටාරම මත ධ්‍යාන සුවයෙන් වැඩ සිටියහ. වදකයන් තව  තවත් ගිනි ගැසූහ. තමන් වහන්සේ පෙර ආත්ම භවයක සිදු කරන ලද පාපයක් නිසා මෙසේ නොකළ වරදකට හසුවී ඇති බව වටහා ගත් උන්වහන්සේ පිරිනිවන් පෑහ. ඉන්පසු උන්වහන්සේගේ දේහය මුහුදට දැමූහ.

රජතුමා කරන ලද මේ පාප ක්‍රියාව පිළිබඳ ඇසූ සියල්ලෝම කම්පාවට පත්වූහ. ලෝක පාලක දෙවිවරුන් කෝපයට පත්ව රජු හා රාජ්‍ය විනාශ කිරීමට මුහුද ගොඩ බිමට ගලාඑන්නට සැලැස්වූහ. මුහුදේ සිට සත් ගව්වක් ඈතින් පිහිටි කැලණි රාජධානියට අයත්ව තිබූ ගම් නියම් ගම් මුහුදට යට විය.

මෙයින් බියට පත් වූ කැලණි තිස්ස රජු නිමිති බලන්නන් ගෙන්වා මේ මහා විනාශයට හේතු විමසීය. රජතුමා රහතන් වහන්සේ නමකට කළ අපරාධය හේතුවෙන් මෙසේ සිදු වන බව නිමිති බලන්නන් පැවසූහ.

මේ මහා විනාශය වළක්වාලීම සඳහා රජුගේ දූ කුමරිය මුහුදට බිලි දිය යුතු බව ඇසූ රජු කම්පාවට පත් විය. නමුත් රජුගේ දියණිය වූ දේවි කුමරිය ස්වකැමැත්තෙන්ම රට බේරා ගැනීමට ඉදිරිපත් විය. දහසය වියැති කුමරිය සරසවා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සමග නැවක නංවා, නැවෙහි අකුරු කොටා කැලණි තිස්ස රජුන්ගේ දූ කුමරිය බව සඳහන් කොට මහ මුහුදේ පා කර හැරියහ.

# එගොඩ කැලණිය

කැලණි ගඟේ දකුණු ඉවුරේ පිහිටා ඇති බෞද්ධ පූජා භූමිය එගොඩ කැලණියයි. කිත්සිරි මෙවන් විහාරය ලෙසද මෙම විහාරය හඳුන්වනු ලබයි. කැලණි ගඟේ එගොඩත් , මෙගොඩත් පිහිටා ඇති කැලණි රජමහ විහාරයත්, කිත්සිරි මෙවන් විහාරයත් වෙන් වී ඇත්තේ කැලණි ගඟ නිසාය. අතීතයේ මෙම ස්ථාන දෙකම එකම භූමියක පිහිටි බවත් කැලණි ගඟ ගලා බසින මාර්ගයද වර්තමානයට වඩා වෙනස් වූ බවත් විශ්වාස කෙරේ.

කැලණි විහාරයේ තිබූ විවිධ පූජනීය ස්ථාන පිළිබඳ සඳහන් කරන සැළලිහිණි සන්දේශයේ සිවුරු දාගැබ පිළිබඳ සඳහන් කර තිබීමත්, 9 වන පරාක්‍රම බාහු හෙවත් ධර්මපරාක්‍රම බාහු රජු පිහිටුවා ඇති කැලණි විහාර සෙල්ලිපියේ සඳහන් කර ඇති විහාර මලුව තුළ එදා තිබූ අංග අතර සිවුරු දාගැබ පිළිබඳ සඳහන් කර තිබීමත්, නිසා අතීතයේ සිවුරු දාගැබ කැලණි රජමහා විහාරයට අයත් භූමිය තුළම පිහිටා තිබූ බව සිතිය හැක.

කිත්සිරි මෙවන් විහාරය හෙවත් එගොඩ කැලණියේ ඇති දාගැබ සිවුරු දාගැබ ලෙස හැඳින්වේ. බුදු රජාණන් වහන්සේ කැලණියට වැඩම කළ අවස්ථාවේදී කැලණි ගඟෙහි ජල ස්නානය කොට ඒ අවස්ථාවේ ඇඳ සිටි සිවුර හෙවත් ජල සාටිකාව තැන්පත් කොට තනවන ලද දාගැබ සිවුරු දාගැබයි.

මෙම සිවුරු දාගැබ පිළිබඳව කැලණියේ විභීෂණ දේවාලයෙන් හමුවූ ක්‍රි.ව 10 වන සියවසට පමණ අයත් වන ටැම් ලිපියක සඳහන් වේ.එහි සඳහන් වන්නේ බුදුන් වහන්සේගේ ජල සාටිකාව තැන්පත් කර ඇති මංගල මහා ස්තූපයට පැවැත්වූ පහන් පූජාව සඳහා කළ පූජාවන් පිළිබඳවය.

එසේම තොටගමුවේ ශ්‍රී රාහුල හිමි විසින් රචිත සැළලිහිණි සන්දේශයේ ද සිවුරු දාගැබ පිළිබඳ සඳහන්ය.

සමනොල    ගිරි  ගිජිඳු දිගු කළ සොඬක    සැටි
සිහිල්’ළ    ගඟැ සිලිල් සනහා  මුනි නො    ගැටි
පැහැදුළ    තුන් සිවුරු  ඇඳ පෙරෙවු වැඩ    සිටි
තැන කළ    සිවුරු දාගැබ වඳු නො පැ    පිටි

ක්‍රි.ව. 301-328 දක්වා කාලයේ අනුරාධපුරයේ රජකම් කළ කීර්ති ශ්‍රී මේඝවර්ණ හෙවත් කිත්සිරි මෙවන් රජු මෙම විහාරය කරවන ලද බැවින් එයට කිත්සිරි මෙවන් විහාරය යැයි ව්‍යවහාරකෙරේ. රජමහා විහාරයක් වන මෙම එගොඩ කැලණියේ පිහිටි විහාරස්ථානයද ඉතා වැදගත් වන අතර එහි ක්‍රි.ව. 1344ට අයත් වන සෙල් ලිපියක් ඇත. මෙම විහාරස්ථානයේ කරන ලද ප්‍රතිසංස්කරණයක් පිළිබඳ එම සෙල්ලිපියෙන් කියවේ.

මෙම එගොඩ කැළණිය හෙවත් කිත්සිරි මෙවන් විහාරයත් කැලණි රජමහා විහාරයත් සම්බන්ධ කරමින් බැතිමතුන්ගේ පහසුව තකා 1825දී කැලණි ගඟ හරහා පාරු පාලමක් ඉදි කෙරිණි. තෝමස් නම් තැනැත්තෙකුගේ මුලිකත්වයෙන් පාරු 21 ක් උපයෝගී කොට ගෙන තැනූ මෙම පාලමේ දිග අඩි 499 ක් පමණ විය. සියලුම යාන වාහන ආදිය ඒ හරහා එතෙර මෙතෙර ගිය අතර ගංගාවෙන් යන ඔරු පාරු වලට ඉඩ දීමට පැය 2ක පමණ කාලයක් පාරු පාලමේ මැදින් පාරු 2ක් ඉවතට ගැනීමෙන් ඉඩ ප්‍රස්ථාව සලසන ලදී. මෙම පාරු පාලම කැලණියේ පෙරහැර කාලයේදී ඉදිකෙරේ.

# බුරුම භික්ෂූන් උපසම්පදා කිරීම

පරිහානියට පත්ව තිබූ බුරුම දේශය හෙවත් එකල රාමඤ්ඤ දේශය, එහි රජු වූ ධම්ම චේතිය රජුගේ කාලයේදී නැවතත් සංවර්ධනය වන්නට විය. නමුත් බෞද්ධාගමික රටක් වූ බුරුමයේ උපසම්පදා කර්මය පැවැත්වීම සඳහා ප්‍රමාණවත් භික්ෂූන් වහන්සේලා නොමැති වන තරමටම රට ඒ වනවිට ආගමික වශයෙන්ද පරිහාණියට පත්ව තිබුණි. ඒ නිසා එවක සිල්වත් භික්ෂූන් වහන්සේලා ලෙස ලෝක ප්‍රකටව සිටි සිරිලක භික්ෂූන්ගෙන් උපසම්පදාව ලබා ගැනීමට එරට මහා නායක තෙරුන් වූ මොග්ගල්ලාන හිමියන් කල්පනා කළහ.

ඒ අනුව බුරුම රජු විසින් ක්‍රි.ව 1474 වර්ෂයේදී රාමදූත නම් අමාත්‍යවරයා ප්‍රමුඛ දූතපිරිස එක් නැවකද, චිත්‍රදූත නම් අමාත්‍යවරයා ප්‍රමුඛ දූත පිරිස තවත් නැවකද නංවා මෙරටට එවන ලදී. මෙයින් රාමදූත ඇතුළු පිරිස රැගත් නෞකාව ලංකාවේ දකුණු ප්‍රදේශයේ වැලිගමටත්, චිත්‍රදූත හා පිරිස රැගත් නෞකාව කොළඹටත් පැමිණ ඇත.

මෙකල බුවනෙක බාහු රජු කෝට්ටේ සිට රාජ්‍ය පාලනය ගෙන ගිය අතර ඔහුට විරුද්ධව ‘සීහල සංගය’ ලෙස හැඳින්වුණු කැරැල්ල ඇතිව තිබුණේ මේ යුගයේදීය. ඒ හේතුවෙන් වැලිගමට පැමිණි දූත පිරිසට මාස 3ක පමණ කාලයක් රජු හමුවීම සඳහා යාමට නොහැකිව එහි රැඳී සිටීමට සිදු විය. පසුව දෙපිරිසම කෝට්ටේ රජු බැහැදැක සන්දේශය හා තුටු පඬුරු ලබා දීමෙන් අනතුරුව උපසම්පදා කර්මය සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණි. ඉතා සතුටට පත්ව සිටි රජතුමා දූත පිරිස වෙනුවෙන් දළදා ප්‍රදර්ශනයක් පවත්වා දළදා පෙරහැරක්ද පැවැත්වීය.

බුරුම භිකෂූන් උපසම්පදා කිරීමේ කාර්යය සඳහා දෙවන වීදාගම මෛත්‍රිය හිමියන්ට මූලිකත්වය සැපයිණි. කැලණි ගඟේ බුදුන් ස්නානය කළේ යැයි සැලකෙන ස්ථානයේ ගඟ මැද තනවන ලද සීමා මාලකයක් හෙවත් ‘උදකුක්ඛෙප සීමාවක්’ තුළ භික්ෂූන් වහන්සේලා විසි හතර දෙනෙකුගේ සහභාගිත්වයෙන් උපසම්පදා කර්මය සිදු කරන ලදී.



බුරුම භික්ෂූන් ගිහි කරවා ලාංකික පැවිද්ද ලබා දී උපසම්පදා කරවන ලදී. විශාල ජනකායකගේ සහ බුවනෙක බාහු රජුගේ සහභාගිත්වයෙන් රටවල් දෙකේ භික්ෂූන් සහභාගි වූ උපසම්පදා කර්මය සිදුකරන ලදී. ඉන් අනතුරුව රජු විසින් බුරුම භික්ෂූන්ට තෑගි බෝග ලබාදී සිංහල නම් ද ලබා දී ඇත.

ඒ අතර ශාසන ඉතිහාසයේ සුවිශේෂී වන ස්ථාන හා නාමයන් සිහිපත් කරවන නම් යොදා ඇත. එනම්, පරාක්‍රම බාහු සාමි, සිරි වනරතන සාමි, සිරි සඟබෝධි සාමි, සිරි මංගල සාමි, සිරි දන්තධාතු සාමි, සද්ධම්ම තේජ සාමි, කල්‍යාණ තිස්ස සාමි, බුද්ධඝෝෂ සාමි, බුවනෙක බාහු සාමි, ධම්මාරාම සාමි, චූලාභය තිස්ස සාමි ආදියයි.

බුරුම භික්ෂූන් වහන්සේලා සිංහල රජුගේ සංදේශයක්ද සහිතව පෙරළා සිය රටට වැඩම කළහ. සිංහල දේශයේ කැලණියේ සිදුකළ මෙම උපසම්පදා කර්මය සිහි කරවීම පිණිස බුරුම රජු තම රටේ කල්‍යාණ සීමා නමින් සීමා මාලකයක් තැනවීය.

තවද කැලණියේ සිදු කරන ලද මෙම උපසම්පදා කර්මය පිළිබඳ කරුණු සඳහන් කොට ශිලා ලේඛනයක්ද පිහිටුවීය. කිරිගරුඬ පුවරුවක කෙළන ලද මෙම ලිපියට උපසම්පදා කර්මයට මූලික වූ සිංහල භික්ෂූන්ගේ නම් පවා සඳහන් කොට ඇත. එම ලේඛනය පාලි භාෂාවෙන් කරවා ඇත.

# සිංහල සාහිත්‍යයෙන් හෙළිදරව්වන කැලණිය

සිංහල සාහිත්‍ය තුළ විශේෂයෙන් ගම්පොළ හා කෝට්ටේ යුගයන් හිදී කැලණිය පිළිබඳ තොරතුරු හෙළිවේ.එම යුගවල ලියවුණු මයුර සන්දේශය, කෝකිල සන්දේශය, තිසර සන්දේශය, සැළලිහිණි සන්දේශය හා හංස සන්දේශය යන සන්දේශ කාව්‍යයන්හි කැලණි පුරවරය, කැලණි විහාරය ආදියේ තොරතුරු සඳහන් කොට ඇත. එකල කැලණි පුරයේ පැවති ශ්‍රී විභූතිය සැළලිහිණි සන්දේශයේ විස්තර වන්නේ මෙසේය.

පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන් වට
නොව පැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වඩු කැලණිය පුර වරට

කැලණි විහාරය පිළිබඳව සැළලිහිණි සන්දේශයේ කවි ගණනාවකින් විස්තර කොට ඇත. එහිදී, කැලණි චෛත්‍යය, බෝධීන් වහන්සේ, වටදාගෙය, පැලදිග ප්‍රාසාදය, ලංකාතිලක පිළිම ගේ, පස්මහල් පාය, තිවංක පිළිමගේ, සමාධි පිළිමය, නා පිළිමය, සල පිළිමය, තෙල්සැළ පිළිමය, සිවුරු දාගැබ, විභීෂණ දේවාලය ආදී ස්ථාන 13ක් පිළිබඳ සැළලිහිණියේ සඳහන් වේ.

## - ලංකාතිලක පිළිමගේ -

දියතෙක් පැතිර සිටි බුදුගුණ කියා හැම
සගමොක් ලබනු වස් පිය යුග ඔබා බිම
සියසක් පුරා දුටු මෙන් තුටුවැ මුනි තුම
වඳුලක් තිලක ගෙයි වැඩ උන් මහ පිළිම

## - සල පිළිමය -

පෙරදල නිඳු දිය කඳ රට බිම් ගලත
සුරකුල හිමි රකිනුව ලක මැවූ සත
මනකල ඒ සමුදුර පැහැයෙන් දිමුත
වඳුසල පිළිම හිමි සිරි සරණ සියපත

## - පස්මහල් පාය -

ගිලිය නොදී සැට මහණුන් බව මහ’ණ
මලිය දෙව් තෙරිඳු වැඩ හිඳ දෙසූ බණ
දිලිය පස් මහල් පායෙහි මිණි කිරණ
බැලිය හැකි වී නම් දැක වැඳ යා කලණ

## - වටදාගේ -

පෙර උවිඳා ගෙන ගිරිදා සිඳු　　සලත
නැගී පැහැදා පෙන සමුදා සැටි　　නුමුත
මෙන උළිඳා පැහැ විහිදා නෙදිගු　　බිත
සැදි වටදා ගෙයි වඳුදා ගැබ　　දිමුත

## - පැලදිග ප්‍රාසාදය -

දිගුනෙත් නිලු‘පුලෙ‘ව් රත’ දර පබළ　　රඟ
සිරිමත් සුපුන් සඳ වැනි වුවන　　මනරඟ
පැහැපත් ලකළ රන්වන් විලසින්　　ලොවග
වැදහොත් පිළිම හිමි වඳුපාය පැළ　　දිග

## - දාගැබ් වහන්සේ -

අහසින් අවුත් මිණි අක් නයිඳු　　යැදුමට
රහතන් මැදෙහි මුනි හිඳ මිණි පලඟ　　පිට
දහමුත් දෙසූ තැන කළ සැට රියන්　　කොට
මහ දාගැප් හිමින් වඳු සොළස තැන්　　සිට

## - නා පිළිමය -

සවන සතිය වැසි වසිනා දස　　දිගෙහි
පෙණින සෙවෙනි මුදලිඳු නා දරණ　　ගෙහි
සවන හිඳිනු දනන‘දනා නෙතු　　යුගෙහි
වඳින මැනවි පිළිමය නා පිළිම　　ගෙහි

## - සමාධි පිළිමය -

සසරින් මුදාලෙව් සදහම්　　අමාදී
එකඟින් මුනිඳු හුන් වැනි　　නිපරමාදී
ලකුණෙන් සපිරි පිළිමය දැක　　සමාදී
වැඳගන් මිතුර තුන් සිත කැරැ　　සමාදී

## - බෝදිය -

අපමුනිඳු බුදු වන දින මුරුන් පිදූ
පැහැවිහිදූ දිලි කලදෝ යටින් යෙදූ
සැදිසිනිදු ඉඳුනිල් මිණි සතෙ‘ක බඳු
වැඳදුමිඳු වන පින් පලත අත් බඳු

## - තිවංක පිළිමගේ -

විටංක පැකිලි‘ඳු දකුණ‘ස දොරටුයෙන
නිසංක යෙන් පුද නන් තුරු ගොස‘සමින
කලංක නොව කළ සුබ ලකුණු බබළන
තිවංක නම් දෙපිළිම නැමඳ බැස ගෙන

## - සිවුරු දාගබ -

සමනොළ ගිරි ගිජිඳු දිගුකළ සොඬක සැටි
සිහිල‘ළ ගහැ සිලිල් සනහා මුනි නො ගැටි
පැහැදුළ තුන් සිවුරු ඇඳ පෙරෙවැ වැඩ සිටි
තැන කළ සිවුරු දාගැබ වඳු නො පැ සිටී

## - තෙල්සැළ පිළිමය -

නිරිඳුන් කැලණිතිස් නිවැරදි රහත් තැන
සැකයෙන් ලැවූ හුණුතෙල් සැළ තුබූ තැන
බැතියෙන් පිනැ‘තියන් කළ විසිතුරු විමන
වැඩහුන් පිළිම හිමි නමඳින් යහදසන

## - විභීෂණ දේවාලය -

පිරිසිඳ නොහැකි මෙවැඳුම් පුද පින් පඬුරු
මෙන බැඳ රැගෙන දෙන ලෙස දැක එසුර විරු
සුර රද පායවන් විජයොත් නම් මහරු
එමසඳ වඩන රජගෙට මිතුර වැඩකරු

මිට අමතරව තිසර, මයුර හා කෝකිල සන්දේශවල කැලණිය පිළිබඳ සඳහන් වී ඇත.

කිරණ විහිදි පහකුලු තුගු කොතින් සැ දූ
නරණ ලියෙවි පියලන පිය ලියන් රැ දූ
දෙරණ නුසුලන මෙන් සව් සිරින් යෙ දූ
කලණ මහ කැලණි පුර පිරි සරින් ව දූ

මීට අමතරව මහනුවර යුගයේ ලියවුණු කැලණි හැල්ල නම් ජනප්‍රිය වන්දනා කාව්‍යයක් ඇත. මහනුවර කවිකාර මඩුවේ සිටි දක්ෂ කවියෙකු වූ ලෝකුරුනයිදේ විසින් මෙම කාව්‍ය රචනා කරන ලදැයි සැළකේ. කවි 65 ක් පමණ අන්තර්ගත වන අතර එහි සෑම කවි පේළියක්ම අවසන් වන්නේ 'යේ' යන අක්ෂරයෙනි. එසේම සෑම කවියකම හතරවන පදය අවසන් වන්නේ 'කැලණියේ' යන පදයෙනි. එහි කවි අතරින් ඉතා ජනප්‍රිය වූ කවියක්ද ඇත. එනම්,

පසක් ගවුතම මුනිඳු බුදුවී සාසනේ ලොව　　පැවතුයේ
එසම්පත් ඇති අයත් මරුවා කැටුව යනවා　　අවදි යේ
වසන් ඇති දා කරපු පින්මයි කැටුව යන්නේ　　පැහැදියේ
උපන්දා සිට කරපු පව් නැත වරක් වැන්දොත්　　කැලණියේ

මෙහි අවසන් පදය ජන සමාජය තුළ බෙහෙවින් ජනප්‍රිය වී ඇත.

# කැලණිය හා බැඳුණු ජනකතා

කැලණිය හා බැඳුණු ජනකතා අතරින් වඩාත්ම ප්‍රචලිත ජනකතාව වන්නේ කැලණිය නාග රාජධානියක් වන බවයි. කැලණියේ මුලින් සිටි නාග ගෝත්‍රිකයින් අතර ඇතිවූ ගැටලුවක් නිරාකරණය කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩම කළ බව සඳහන්ය. කැලණි විහාරය ගොඩ නැගුවේ මණි අක්ඛිත නම් නා රජුය බව සඳහන්ය. කැලණි ගඟ යට නාග රාජධානියක් පවත්නා බව අදටත් කැලණි ගම් වැසියන් අතර විශ්වාසයක් පවතී.



සැළලිහිණි සන්දේශය රචනා කළ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් කැලණි ගඟ අසබඩ සිටින නාග කන්‍යාවන් පිළිබඳ සඳහන් කර ඇත.

'මනහර නා මණෙවියනි'ද ළවැලි පිට'

මෙවන් නොයෙක් මත මතාන්තර නිසා කැලණිය නාග රාජධානියක් වශයෙන් සැලකේ.

කැලණි ගඟේ කැලණි විහාරය ඉදිරිපිට ඇති තොටුපල සම්බන්ධවද විවිධ මත මතාන්තර ඇත. වසරක් පාසා එම ස්ථානයේ බිල්ලක් ගන්නා බවට මතයක් පවතී. ඒ නිසාම එම ස්ථානයේ ජල ස්නානය කිරීමට හා කිමිදීමට මිනිසුන් තුළ එතරම් කැමැත්තක් නොමැත. මේ ස්ථානය තුළ ජලය අඩු කාලයේ කිමිදෙන්නන් විවිධ දේ පවසති.

ගං පතුල අන්ධකාර බවත් නොයෙක් ශබ්ද ඇසෙන බවත් ඔවුන් පවසති. ගං පතුලේ නටබුන්ව ගිය ගල් කණු, රූප, ප්‍රතිමා ආදිය ඇති බවටත් මත ප්‍රචලිතවී ඇත. ගම්වැසියන් විශ්වාස කරන අන්දමට මෙම ස්ථානයේ පැරණි රජමාළිගයක නටඹුන් ඇත. මෙය කැලණිතිස්ස රජ මාලිගය බව ඇතැම්හු පවසති.

කැලණියේ ප්‍රකට තවත් මතයක් කැලණි තිස්ස රාජ්‍ය කාලය තෙක් දිව යයි. එනම් කැලණි තිස්ස රජු තම දියණිය වූ දේවි කුමරිය මුහුදට බිලි දීමෙන් පසු ඇතිවූ කලකිරීම නිසා තම මංගල හස්තියාගේ පිට නැග නිනව්වක් නොමැතිව යන විට ඇතු සමගම වලක වැටී මිය ගිය බවයි. මුහුද ගොඩ ගැලීම නිසා මං මාවත්

ජලයෙන් යටවී තිබූ අතර එසේ වතුරෙන් පිරී තිබුණු වලකට වැටුණු රජු දියේ ගිලී මැරුණු බවට ජනයා විශ්වාස කරති. එම ස්ථානය පිළිබඳව කෝකිල සංදේශයට අනුවද හෙළිවේ.එනම්,

මතුවනු නොදැන ගුරු එරහත් හිමි නිමල
සිතු විකලින් බඳනෙහි ලමිනි උණු තෙල
ඇතු සහ නිරිඳු ගෙන ගිය මහ පොලෝ තෙල
ඇතුබුන් වලයි යෙති ඒ දකු මහ අසල

-කෝකිල සංදේශය



- නිමි -